ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි : 01/2022

මගේ අංකය : PA/CS/POLICY/පොදු
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.01.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට අදාල පාඨමාලාව සම්බන්ධවයි</u>**

අංක 1840/34 දරණ 2013.12.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් I ශ්‍රේණියට පත්වූ දින සිට වසර 05ක් ඇතුළත එම ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුව ඇත.

02. ඒ අනුව මේ වන විටත් I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සපුරා ඇතත් I ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් වැටුප් වර්ධක අහිමි වී ඇති නිලධාරීන් සඳහා ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි : 02/2019 මගින් 2021.01.01 දින දක්වා ලබා දී තිබූ සහන කාලය, 2022.12.31 දින දක්වා දීර්ඝ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/4/62/2018 හා 2021.11.08 දිනැති ලිපියෙන් දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්